පැවරුම් අංක 03

**ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තිය පිළිබඳ සලකා බැලීමේ දී දැකිය හැකි සුවිශේෂී ම ලක්ෂණය වන්නේ අසම ජන ව්‍යාප්තිය යි.** එනම් ඇතැම් ප්‍රදේශවල වැඩියෙන් ජන සංඛ්‍යාව ඒකරාශී වී සිටින අතර තවත් ප්‍රදේශවල අඩුවෙන් ජන සංඛ්‍යාව ඒකරාශී වී සිටීමයි.ඒ සඳහා විවිධ භෞතිකමය හේතූන් මෙන් ම ආර්ථික හා සමාජීය හේතු සාධක බලපානු ඇත.ඒ අනුව මෙරට තෙත් කලාපයේ වැඩි ජන ව්‍යාප්තියක් ද සාපේක්ෂව වියලි කලාපයේ අඩු ජන ව්‍යාප්තියක් ද දැකිය හැකි ය.

(පෙළ පොත පිටු අංක 64,65 හි "ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය" කොටස තව දුරටත් අධ්‍යයනය කරන්න)

1) ලංකාවේ පළාත් අනුව ජන ව්‍යාප්තිය සලකා බැලීමේ දී වැඩිම ජන ව්‍යාප්තියක් සහිත හා අඩුම ජන ව්‍යාප්තියක් සහිත පළාත් දෙක පිළිවෙලින් නම් කරන්න
2) මෙරට ජන සංඛ්‍යාව අඩුම දිස්ත්‍රික්කය හා වැඩිම දිස්ත්‍රික්කය නම් කරන්න.
3) ලංකාවේ මුළු ජන සංඛ්‍යාවෙන් ¼ ක් (28.8%) පමණ බස්නාහිර පළාත තුළ ඒකරාශී වී පවතී.මෙලෙස බස්නාහිර පළාත තුළ ජන සංඛ්‍යා ව්‍යාප්තිය වැඩි වීමට බලපෑ හේතු පැහැදිලි කරන්න.
4) ලංකාවේ අසම ජන ව්‍යාප්තියකට බලපෑ භෞතික, ආර්ථික හා සමාජීය සාධක එක බැගින් කෙටියෙන් විස්තර කරන්න.
5) මෙලෙස ලංකාවේ පවත්නා අසම ජන ව්‍යාප්තිය අවම කිරීම සඳහා ඔබ කරන යෝජනා 3ක් ලියන්න.
6) පෙළ පොත 4.4 ප්‍රස්තාරය (පිටුව 66) ඇසුරින් ලංකාවේ ග්‍රාමීය, නාගරික හා වතු වශයෙන් ජන සංඛ්‍යා ව්‍යාප්තිය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.
7) ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තිය ඇසුරින් පහත දී ඇති දේ ලංකා ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න.
   I. ජන ව්‍යාප්තිය වැඩිම පළාත
   II. ජන ව්‍යාප්තිය අඩුම පළාත
   III. වැඩිම ජන ඝනත්වයක් සහිත දිස්ත්‍රික්කය
   IV. අඩුම ජන සංඛ්‍යාවක් සහිත දිස්ත්‍රික්කය